**දෙවිනුවර ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලී බඩු හා උපකරණ අයිතම 07 කට අදාලව මුළු පිරිවැය රු.82,198 ක් අඩුවෙන් හා කර්මාන්ත 04 කට අදාලව ගෙවිය යුතු කර්මාන්ත ණය හිමි ශේෂය රු.227,189 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | වැඩ ආරම්භ කර නොතිබූ කපුගම මිල්ලවැව චතුරි පෙර පාසලේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.491,641 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදි කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම වෙනුවෙන් දරන ලද රු.2,060,282 ක වියදම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදි කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබූ ආදායම් ශීර්ෂ 03 කට අදාළව රු.123,790 ක් නඩු පැවරීම හේතුවෙන් කපා හැරීම නිසා ලැබිය යුතු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලද රු.127,715 ක ස්ථාවර තැන්පතු පොලිය සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | පසුගිය වර්ෂවලට අදාළව වැඩිපුර ගෙවීම් සඳහා අය කරන ලද රු.86,160 ක් ප්‍රතිපාදන සලස්වා නොගෙන මුදල් ගිණුම හර කර අධිකතා හා ඌනතා ගිණුම බැර කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හිඟහිටි කුලී ආදායම් ශේෂය රු.12,702,441 ක් වුවද ඊට අදාළ උපලේඛණ අනුව ශේෂය රු.11,873,095 ක් වීම නිසා රු.829,346 ක වෙනසක් පැවතුණි. | වට්නාකම් සඳහන් කිසිඳු උපයෝගී ලේඛනයක් නොමැති බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.189,074,953 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කර 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග තොරතුරු ඇතුළත් කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,491,763 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,240,880 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු ගිණුම් 04 කට අදාළව පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනවල දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන රු.49,414 ක් වූ හඳුනා නොගත් ශේෂ 05 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වට්නාකම්වල ශුද්ධ අගය රු.12,364 ක ශේෂය දකුණු පළාත් ආණ්ඩුකාරවර අනුමැතිය ලබා ගෙන සමුච්චිත අරමුදල් ගිණුමට බැර කිරීම සඳහා අදාළ කටයුතු සිදු කරන බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම රු. | 2023 බිල් කළ ආදායම රු. | 2023 රැස්කළ ආදායම රු. | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | 2022 ඇස්තමේන්තු ගත ආදායම රු. | 2022 බිල් කළ ආදායම රු. | 2022 රැස්කළ ආදායම රු. | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 3,585,236 | 2,887,132 | 2,733,790 | 6,099,639 | 2,923,135 | 1,924,480 | 1,380,399 | 5,946,297 |
| (ii) | කුලී | 26,595,120 | 28,887,419 | 30,825,118 | 12,702,441 | 26,036,460 | 4,388,695 | 3,892,244 | 14,640,140 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,399,900 | 4,184,864 | 4,160,404 | 181,250 | 5,075,500 | 810,040 | 884,225 | 156,790 |
| (iv) | වෙනත් ආදායම් | 16,410,800 | 10,744,038 | 7,793,138 | 3,467,456 | 7,314,800 | 1,338,664 | 917,574 | 516,556 |
| | | 49,991,056 | 46,703,453 | 45,512,450 | 22,450,786 | 41,349,895 | 8,461,879 | 7,074,442 | 21,259,783 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.5,865,770 ක් වූ අතර, වරිපනම් ඒකක 3588 කට අදාළව වර්ෂය තුළදී බිල් කිරීම් රු.1,920,131 ක් සමඟ රු.7,785,901 ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම රු.1,763,511 ක් වීම නිසා වර්ෂය අවසානයට රු. 6,022,390 ක හිඟ ශේෂයක් පැවතුණි. | එම හිඟ ශේෂයෙන් රු.865,383 ක මුදලක් මේ වන විට අය කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කර වාර්ෂික වටිනාකම මත බදු අයකළ යුතු වුවත්, වරිපනම් ඒකක 3300 ක දේපල තක්සේරුව 2011 වර්ෂයෙන් පසු යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 ඔක්තෝබර් 27 දින දේපල තක්සේරුව සඳහා ලේඛන තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව සතු කුලී ගෙවන කඩ කාමර 129 කින් 84 කට අදාලව රු. 11,873,095 ක් හා වෙළෙඳ සංකීර්ණ 04 ක කඩකාමර, මාළු ලැලි හා තාවකාලික බිම් අල්ලි 44 ක් භාවිතයට නොගෙන වසා දමා තිබීම නිසා රු. 2,934,971 ක හිඟ කුලියක් අයවිය යුතුව පැවතුණි. | නිරීක්ෂණ පිළිගන්නා බව හා හිඟ මුදල් ද ගෙවා නොමැති තව දුරටත් වසා දමා ඇති කඩ කාමර, බිම් අල්ලි, මාළු ලැලි සභාව වෙත පවරා ගැනීම සඳහා බදු හිමියන් දැනුවත් කර ලිපි යොමු කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ඈ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 11 ඡේදය ප්‍රකාරව බදුකරු වෙනත් පාර්ශවකරුවෙකු වෙත බදු අයිතිය පැවරීම සභාවේ අනුමැතියකින් තොරව සිදුනොකළ යුතු වුවත්, සභාව | අතුරු බදු දී තිබූ කඩ කාමරවලින් කෝපිවත්ත අංක 03 කඩ කාමරය සඳහා සන්තකය පවරා ගැනීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි එතෙක් හිඟ මුදල බදු | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | සතු වෙළෙඳ සංකීර්ණ 03 ක්, කඩකාමර 14 ක් වෙනත් පාර්ශවයක් විසින් භාවිතයට ගෙන තිබුණි. | කරුගෙන් ලබා ගෙන එම බදු කරුටම නැවත කඩ කාමරය ලබා දෙන ලද බව. | |
| (ඉ) | දෙවිනුවර ප්‍රාදේශීය සභාවට අයත් කෝපිවත්ත කඩ කාමර අංක 03, රු.13,000ක මාසික කුලියට ලබා දී තිබූ බදුකරු විසින් දෙවිනුවර ඇසළ උත්සවය පැවැත්වෙන දින 15 ක් සඳහා රු.150,000 කට අතුරු බදු දී තිබූ අතර මෙම අතුරු බදුදීම සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂකවරුන් සොයා බලා සභාවට වාර්තා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 ජූලි 25 දින සිට දින 15ක් ආපන ශාලාවක් පැවැත්වීම සඳහා මෙම කඩ කාමරය ලබා දී ඇති බවත්, කඩ කාමරය ඒ සඳහා සකස් කිරීම 2023 ජූලි 24 දින සිදු කර ඇති බවත්, එම කඩ කාමරය 2023 ජූලි 23 දින තෙක්ම පෞද්ගලික උපකාරක පංති පවත්වා ඇති බවත්, 2023 අගෝස්තු 09 දින ආපන ශාලාව ඉවත් කර තිබූ බව. | නීත්‍යානුකූල බදුකරුවන් විසින් අතුරු බදු දීම් පිළිබඳව සොයා බලා කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් උසාවි දඩ වෙනුවෙන් රු.999,316 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.59,798,885 ක් ලැබිය යුතුව තිබුණි. | නිරීක්ෂණ පිළිගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෛනිකව එකතුවන කසළ ටොන් 3 ½ කට ආසන්න ප්‍රමාණය කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට හා නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සභාවට නොතිබුණු බැවින් වැල්ලමඩම මෝලවත්ත නමැති ඉඩමට බැහැර කර පස් දමා වසා දමා තිබුණ අතර මේ නිසා ප්‍රදේශයේ වසංගත රෝග පැතිර යාමේ අවධානමක්ද පැවතුණි. | 2024 මාර්තු මාසයේ සිට, දිරන කසළ හා නොදිරන කසළ වෙන් කර ලබා ගැනීමට කටයුතු කර ඇති බවත්, දිරන කසළ වැල්ලමඩම ඉඩමට බැහැර කිරීමටත්, නොදිරන කසළ මාසිකව, ගාල්ල මොන්රෝවියාවත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කිරීමටත් තීරණය කර ඇති බව. | විධිමත් කසළ කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |

**3.2 අනාථරීක ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේදී එක්තරා සමාගමකින් රු. මිලියන 9.95 කට අවිධිමත් ලෙස මිල දී ගත් ටෙරෙක්ස් 820 බැකෝ යන්ත්‍රය සඳහා රු. මිලියන 3.995 ක් ණය මුදලකින් හා සභා අරමුදලින් ගෙවා ඉතිරි මුදල රු.මිලියන 5.995 නොගෙවීම නිසා අදාළ සමාගම නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් නීතිඥ ගාස්තු ලෙස රු.112,007 ක වියදමක්ද මිලදී ගත් අවස්ථාවේ ලියාපදිංචි සහතිකය ලබා නොගැනීම හේතුවෙන් රු.68,305 ක වියදමක් ද දැරීමට සිදුව තිබුණි. | නිරීක්ෂණ පිළිගන්නා බව. | මිලදී ගැනීම් නිසි ක්‍රමවේදයට අනුව සිදු කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා 2022 දෙසැම්බර් 15 දිනැති පළාත් පාලන චක්‍රලේඛ අංක 2022/01 ප්‍රකාරව මාර්ගගත ක්‍රමවේද හඳුන්වාදීම අනිවාර්ය වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වෙබ් අඩවියක් නිර්මාණය කර මාර්ගගත ගෙවීම් පහසුකම් සැලසීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් මුදල් අය කිරීමකින් තොරව මෘදුකාංගය ලබා ගත හැකිද මිල ගණන් කැඳවූ ආයතනයෙන් ස්ථාපනය කළ හැකි ද යන්න පිළිබඳව පළාත් පාලන කොමසාරිස් වරයාගෙන් උපදෙස් ඉල්ලා ඇතත් මේ වන තෙක් ඒ සම්බන්ධයෙන් කිසිඳු උපදෙසක් හෝ නිර්දේශයක් ලැබී නොමැති බවත්, එබැවින් මාර්ග ගත ගෙවීම් මෘදුකාංගය ඇතුළත්ව වෙබ් අඩවිය ස්ථාපනය කිරීම ගැටළු සහගත තත්ත්වයක පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රු. මිලියන 9.95 ක් වටිනා බැකෝ යන්ත්‍රය සඳහා ලියාපදිංචි සහතිකය සහ රක්ෂණ ආවරණය ලබා නොගෙන සේවයේ යෙදීම නිසා 2019 වර්ෂයේ දී අනතුරට පත් වූ පසු සමාලෝචිත වර්ෂයේදී සිදුකළ මු.රෙ 104(4) වාර්තාව ප්‍රකාරව අදාළ පාර්ශවයන්ගෙන් සිදුවූ හානි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අලාභ අය කර ගැනීම සඳහා හිටපු සභාපති සහ විශ්‍රාමික ලේකම්වරයා හට වරින් වර දැනුවත් කළ ද මේ වන තෙක් එම අලාභය ගෙවීමට කටයුතු නොකිරීම නිසා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට තීරණය කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව මුළු ආදායමට අදාලව සියයට 1 නොඉක්මවන ගාස්තු අයකල යුතු වුවද සභා බලප්‍රදේශයේ පිහිටි හෝටලයකින් ඉකුත් වර්ෂයට අදාළව රු.1,719,64 ක් වෙනුවට රු.778,277 ක් අයකිරීම හේතුවෙන් රු.941,187 ක් අඩුවෙන් අයකර තිබුණි. | අදාළ ආයතනය ලබා දී ඇති ආදායම් වියදම් වාර්තාව අනුව ආදායම වූ රු. 77,827,708 ට අදාළව සියයට 1 බදු මුදල වූ රු.778,277 ක මුදල අය කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 10(6) වගන්තිය ප්‍රකාරව 2016 සිට 2020 දක්වා කාල පරිච්ඡේදය තුළ ගොඩනැගිලි අයදුම්පත්‍ර 761 ක් අනුමත කර ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර ලබාදී වසර 03 ත් වසර 07 ත් අතර කාලයක් ගත වී තිබූ නමුත් ගොඩනැගිලි 100 කට පමණක් අනුකූලතා සහතික ලබාගෙන තිබුණි. | තාක්ෂණික නිළධාරීන්ගේ කාර්ය බහුලත්වය හේතුවෙන් පසු විපරම් කිරීමේ කටයුතු සිදු කළ නොහැකි බැවින් අනුමත කර අවසන් ගොඩනැගිලි බලපත්‍රවල අදාළ ඉදි කිරීම් අවසන් කර ඇත්නම් වලංගු කාලය ඉකුත් වීමට පෙර අනුකූලතා සහතිකය ලබා ගන්නා ලෙසත් එසේ නොමැතිනම් බලපත්‍රයේ වලංගු කාලය දීර්ඝ කර ගන්නා ලෙසත් දන්වා ලිපි යොමු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් කළමනාකරණ සේවා නිලධාරින්ගේ සංගමය විසින් වාර්ෂිකව පවත්වනු ලබන සම්මේලනය සඳහා සභාවේ නිලධාරීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් කිසිඳු නෛතික ප්‍රතිපාදනයක් සලසා නොතිබියදී පසුගිය හා සමාලෝචිත වර්ෂයන්හි රු. 254,000 ක් බාහිර පාර්ශවයක් වෙත සභා අරමුදලින් ගෙවා තිබුණි. | මේ සඳහා දකුණු පළාත් ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී ඇති බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙවිනුවර නව වෙළෙඳ සංකීර්ණයේ අංක UFC 17 කඩ කාමරයට අදාළව වැරදි ලෙස බිල් කර තිබූ රු.85,570 ක කුලිය හා අධි ගාස්තුව ආණ්ඩුකාරවර අනුමැතිය ලබා නොගෙන පොත්වලින් කපාහැර තිබුණි. | ආණ්ඩුකාරවර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | ආණ්ඩුකාරවර අනුමැතිය ලබාගත යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කපුගම මිරිස්වත්ත ඉඩමෙහි සභාවට අයත් පර්චස් 10.44 ක පමණ ඉඩම් කැබැල්ල වර්ෂ කිහිපයක සිට අනවසර පදිංචිකරුවන් විසින් පරිහරණය කරන බැවින් ඒ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් වෙතින් අවශ්‍ය උපදෙස් කඩිනමින් ලබාගෙන එම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කපුගම මිරිස්වත්ත ඉඩමෙහි සන්තකය පවරා ගැනීම සඳහා අදාළ ලිපි ගොනුව පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති බව. | අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු ලංකා බැංකුව පවත්වාගෙන ගොස් තිබූ ගොඩනැගිල්ල 2019 වර්ෂයේ සිට ඵලදායි කාර්යයක් සඳහා යොදවා ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | පැරණි ලංකා බැංකු ගොඩනැඟිල්ලෙහි පුස්තකාලය ස්ථාපනය කිරීමට තීරණය කර ඇති බවත්, මේ වන විට අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | වත්කම් ඵලදායී ලෙස යොදාගත යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී දෙවිනුවර වරාය මාර්ගය තාර අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. 899,680 ක් වැයකර තිබුණු අතර, ස්ථාන 8 ක තාර ඇතිරුම ගැලවී වලවල් හැරී තිබුණි. තවද ජලනල එලීම සඳහා මාර්ගයේ ස්ථාන කීපයක් පලුදු කර තිබුණද එම කොටස් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත් සමිතිය මෙම පළුදු වීම් සකස් නොකිරීම නිසා රැඳවුම් මුදලින් සභාව විසින් පළුදු වූ ස්ථාන සකස් කිරීමට කටයුතු කර ඇති බව. | කඩිනමින් අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | තලල්ල කන්ද මුදුන ක්‍රවුන් සිටි මාර්ගයේ කාණු පද්ධතිය ඉඩම් වෙන්දේසි කිරීමේ දී නිසි පරිදි සකස් නොකිරීම හේතුවෙන් රු. 952,022 ක් වැය කිරීමට සිදු වී තිබුණි. තවද කාණුවේ පැවතිය යුතු ගැඹුර හා ජල බැස්ම සඳහා ප්‍රමාණවත් ආනතියක් නොතබා ඉදිකර තිබූ බැවින් ජලය බැසයාම දුර්වල මට්ටමක හා ජලය එක්රැස්වී පැවතීම හේතු කරගෙන ඩෙංගු වැනි වසංගත රෝග පැතිරීමේ අවදානමක් ද පැවතුණි. මෙම කාණුව සංවර්ධනය කිරීමෙන් පසු කාණුව ඉදිකර තිබූ කොටසෙහි වැසි දිනවලදී මාර්ගය ජලයෙන් යට වන තත්ත්වයක් ද පැවතුණි. | මාර්ගයේ ආරම්භක හා අවසාන ස්ථානවල කාණුව ඉදිකිරීමට අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර අනුමත කරගෙන ඇති බවත්, කලින් ඉදිකළ කාණුවේ පවතින අඩුපාඩුද සකස් කිරීමට කටයුතු කරන බව. | ඉඩම් වෙන්දේසි කිරීමේදී අදාළ මාර්ග හා කාණු පද්ධතිය නිසි ප්‍රමිතියට ඉදි කරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2014 වර්ෂයේ රු.1,271,174 ක වියදමක් දරා අඩක් නිම කරන ලද ගන්දර සෞඛ්‍ය මධ්‍යස්ථානය 2024 අප්‍රේල් 25 දින වන විටත් වැඩ නිමකර ඵලදායි කාර්යයක් සඳහා යොදා ගැනීමට සභාවේ වගකිව යුතු පාර්ශවයන් කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිල්ල ඉදිකර අවසන් කර ගන්දර පුස්තකාලය එහි ස්ථාපනය කිරීමට කටයුතු කරන බව. | මුදල් ඵලදායිව යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ සේවය කළ, සේවය හැර ගිය, හා විශ්‍රාම ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අයවියයුතු එකතුව රු. 306,137 ක ණය ශේෂය වසර ගණනාවක සිට අය නොවී පැවතුණි. | එක් අයෙකුගෙන් අයවියයුතු ණය වාරික විශ්‍රාම පාරිතෝෂිකයෙන් අඩුකරගැනීම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බවත්, සේවය හැර ගිය විදුලි කාර්මික සම්බන්ධයෙන් පැමිණිල්ලක් සමථ මණ්ඩලය වෙත ගොනුකර ඇති බවත් ඉදිරියේ දී එම තීන්දු ප්‍රකාරව කටයුතු කරනු ලබන බව. | හිඟ සේවක ණය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |